19

# ජෝර්ජ් බ්‍රාක්ගේ සිතුවම්හි පිළිබිඹු වන විශ්ලේෂණාත්මක ඝනිකවාදී ලක්ෂණ

*සඳමාලි කමල්චන්ද්‍ර බද්දෙගම* [1]
HU/2011/0056

ජෝර්ජ් බ්‍රාක්ගේ සිතුවම්හි ඝනිකවාදී ලක්ෂණ හඳුනා ගත හැකිවේ. ඝනිකවාදයේ ප්‍රථම අවස්ථාව "විශ්ලේෂණාත්මක ඝනිකවාදය" (Analytical Cubism) යනුවෙන් හැඳින්වූ අතර විශ්ලේෂණාත්මක ඝනිකවාදී ලක්ෂණ බ්‍රාක්ගේ සිතුවම්හි හඳුනාගත හැකිවේ. ජෝර්ජ් බ්‍රාක්ගේ සිතුවම් අධ්‍යයනය කිරීමේදී ද්විතියික මූලාශ්‍රය ලෙස පුස්තකාල පරිශීලනයත් තෘතියික මූලාශ්‍ර ලෙස කලා සඟරා සහ අන්තර්ජාලය දැක්විය හැකි ය. චිත්‍රය මඟින් හැඟීම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය ප්‍රතික්ෂේප කළ ජෝර්ජ් බ්‍රාක් හැඩතල හා වර්ණය මඟින් චිත්‍රයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව වැඩි උනන්දුවක් දැක්වූ බව සිතුවම් මඟින් පැහැදිලි වේ. ජ්‍යාමිතික ලක්ෂණ මොහුගේ සිතුවම් තුළ බහුලව දක්නට ලැබුණු අතර පැහැදිලි හැඩතල වලට ගැඹුරක් එක්කර ඇති අයුරු මෙහි දක්නට ලැබුණු විශේෂත්වයයි. බ්‍රාක්ගේ සෑම සිතුවකම දැකගැනීමට හැකි සත්‍යවූයේ ස්වභාවික ලෝකයේ ඇති ඝනික ස්වභාවයයි. ස්වභාවික හා නිර්මිත ලෝකයේ ඇති සෑම අජීවී වස්තුවකම ජ්‍යාමිතිය ඇති බව මොහු දැඩි ව විශ්වාස කළේය. යමක් මතුපිටින් දකින දෙයට වඩා අභ්‍යන්තරය විනිවිද දැකීමෙන් සැඟවුණ ජ්‍යාමිතික සත්‍ය සංරචනය කිරීමට බ්‍රාක්ට හැකිවිය. ස්වභාවික හැඩතල කොටස්වලට කඩා පෙරබිම හා පසුබිම අතර සබඳතාවක් ගොඩ නැගෙන පරිදි එකිනෙක දිශාවන්ට හැරුණු ජ්‍යාමිතික හැඩතල තලය මත ගොඩනැගුණු බව බ්‍රාක්ගේ සිතුවම් ඔස්සේ පැහැදිලි වේ. වර්ණයේ හා හැඩයේ සම්මිශ්‍රණය එකිනෙක වෙන වෙනම ඉස්මතු වී පෙනීම හා ඒමඟින් මතුවන ගැඹුර විනිවිද දැකීමද මෙහි විශේෂත්වයයි. යම්කිසි වස්තුවක් බාහිර ස්වරූපය බිඳ දමා එය නිමවුණු ව්‍යුහය එකිනෙකට තුලනාත්මක ව ගැළපෙන ජ්‍යාමිතික තලයන් කිහිපයක් සම්බන්ධ කිරීමෙන් සිතුවම් නිර්මාණය කිරීමට බ්‍රාක්ට හැකිවිය. මෙතෙක් නොවූ විරූ අන්දමට වැඩි වශයෙන් ඍජු රේඛාවන් සෑදුණු නොයෙක් ආකාර ජ්‍යාමිතික අකෘතීන්ගෙන් සෑදී බොහෝවිට අඳුරු ඒකවර්ණ චිත්‍රයන් බ්‍රාක් අතින් නිර්මාණය විය. ඕනෑම වස්තුවක් චිත්‍රගත කිරීමේදී ජෝර්ජ් බ්‍රාක් මෙම නව සම්ප්‍රදාය යොදා ගත්තේය. ඒ අනුව, මෙම පර්යේෂණයේ මූලික අරමුණ බවට පත් වන්නේ ජෝර්ජ් බ්‍රාක්ගේ සිතුවම්වලින් පිළිඹිබුවන විශ්ලේෂණාත්මක ඝනිකවාදී ලක්ෂණ පිළිබඳ විමසා බැලීම ය.

ප්‍රමුඛ පදඃ විශ්ලේෂණාත්මක ඝනිකවාදය, ජ්‍යාමිතිය, ව්‍යුහය, ගැඹුර

*1 දෘශ්‍ය කලා හා සැලසුම්කරණය (විශේෂවේදී) තෙවන වසර*